සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

8730

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2019**
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 07 | විෂයය / பாடம் / Subject ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper I ,II | කාලය / காலம் / Time පැය 02යි. |

නම:-.................................................... විභාග අංකය:-..................................................

සැලකිය යුතුයි.
- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටසේ 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලේ ම නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

## I කොටස

01. අතීතයේ අපේ රටේ සිටි ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූයේ මින් කුමක් ද?
    1. ධීවර කටයුතු වල යෙදීම.
    2. කෘෂිකර්මාන්තයේ යෙදීම.
    3. කර්මාන්ත සිදු කිරීම.
    4. වෙළෙඳාමේ නිරත වීම.

02. සහෝදරයන් පස් දෙනෙකු එක් වී වනයක් එළි පෙහෙළි කර උඳු වැපිරීමට හේනක් සකස් කිරීම පිළිබඳ කතා පුවතක් සඳහන් වන මූලාශ්‍රය වන්නේ
    1. මහා වංසය ය.
    2. සද්ධර්මාලංකාරය ය.
    3. සීහළවත්ථු ග්‍රන්ථය ය.
    4. සහස්සවත්ථුපකරණය ය.

03. මෙරට මූලාශ්‍ර වල සඳහන් වන පරිදි රුවන්මැලි සෑය අලංකාර කිරීමට රෝමයෙන් පබළු ගෙන්වා ගත් රජතුමා මින් කවුරුන් ද?
    1. දුටුගැමුණු
    2. මහසෙන්
    3. භාතිකාභය
    4. දේවානම්පියතිස්ස

04. මානවම්ම රජතුමාගේ චරිතයෙන් ඔබට ගත හැකි වටිනා ආදර්ශය කුමක් ද?
    1. සැලසුම් සහගතව කටයුතු කිරීම.
    2. අධිෂ්ඨානශීලීව හා ඉවසිලිවන්තව කටයුතු කිරීම.
    3. විදේශ රටවලින් යුධ ආධාර ලබා ගැනීම.
    4. පරාජය හමුවේ නොසැලී සිටීම.

05. පියාගෙන් පසුව පුතාට රජකම උරුම වීමේ සම්ප්‍රදාය අනුව රාජ්‍යත්වයට පත් රජවරු ඇතුළත් පිළිතුර තෝරන්න.
    1. දුටුගැමුණු රජුගෙන් පසු සද්ධාතිස්ස රජුට
    2. පළමුවන සේන රජුගෙන් පසු දෙවන සේන රජුට
    3. නවවන අග්ගබෝධි රජුගෙන් පසු පළමුවන සේන රජුට
    4. පණ්ඩුකාභය රජුගෙන් පසු ව මුටසීව රජුට

06. මානවම්ම පෙළපතේ පාලන අවධිය වන විට රට තුළ යහපත් මූල්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියක් පැවති බවට සාක්ෂි ලැබෙන සෙල්ලිපියක් වන්නේ,
    1. තෝනිගල සෙල්ලිපිය ය
    2. වේවැල්කැටිය සෙල්ලිපිය ය.
    3. මිහින්තලා පුවරු ලිපිය ය.
    4. දෙවනගල සෙල්ලිපිය ය.

07. දුඹුටුලු වැව හා තෝපා වැව යන වැව් ඒකාබද්ධ කිරීමෙන් බිහි වූ විශිෂ්ට තම වාරි නිර්මාණය වන්නේ මින් කුමක්ද?
    1. පරාක්‍රම සමුද්‍රය
    2. කලා වැව
    3. මින්නේරිය වැව
    4. සොරබොර වැව

08. තුන් නිකාය සමගි කොට සංඝ ශාසනයේ සමගියක් ඇති කළ පොළොන්නරු පාලකයා කවුරුන් ද?
1. මහා විජයබාහු
2. මහා පරාක්‍රමබාහු
3. නිශ්ශංකමල්ල
4. දෙවන විජයබාහු

09. අතීත රාජ සභාව තුළ නිලධාරීන්ගේ නම සඳහන් කරමින් ආසන පනවා තිබූ බවට තොරතුරු හෙළි වන්නේ කුමන ස්ථානයකින් ද?
1. නිශ්ශංකමල්ල රජුගේ රාජසභාව
2. පරාක්‍රමබාහු රජුගේ රාජසභාව
3. නිශ්ශංකලතා මණ්ඩපය
4. සත්මහල් ප්‍රාසාදය

10. අපේ සංස්කෘතික උරුම අතරින් අස්පෘශ්‍ය උරුම පමණක් සඳහන් පිළිතුර තෝරන්න.
1. ඇළවේලි හා වැව් අමුණු
2. ආගමික ස්ථාන, රජ මාලිගා
3. රංග කලාව, ජනකවි
4. බලකොටු, උද්‍යාන

11. ආගමික සිරිත් වලට මුල්තැන දෙමින් තෛපොංගල් සහ රාමලාන් උත්සව පවත්වන ජනතාව පිළිවෙළින් දක්වෙන පිළිතුර තෝරන්න.
1. බෞද්ධ සහ හින්දු
2. ඉස්ලාම් සහ ක්‍රිස්තියානි
3. හින්දු සහ ඉස්ලාම්
4. හින්දු සහ ක්‍රිස්තියානි

12. වෙස් මුහුණු කලාව පිළිබඳ ප්‍රසිද්ධියට පත් අම්බලන්ගොඩ සහ උඩුපිල නගර පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ කුමන පළාතේ ද?
1. උතුරු 2. බස්නාහිර 3. මධ්‍යම 4. දකුණු

13. පොළොන්නරුව රාජධානියේ අවසන් පාලකයා වන්නේ
1. දෙවන ගජබාහු රජතුමා ය.
2. පරාක්‍රම පාණ්ඩ්‍ය රජතුමා ය.
3. නිශ්ශංකමල්ල රජතුමා ය.
4. වික්‍රමබාහු රජතුමා ය.

14. තුන්වන විජයබාහු රජුගේ විශිෂ්ට සේවාවක් පහත පිළිතුරු අතරින් තෝරන්න.
1. බෙලිගල දළදා මැදුරක් ඉදිකිරීම
2. විදේශ ආක්‍රමණ පරාජය කිරීම
3. යාපහුව රාජධානිය පිහිටුවීම
4. වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කරවීම

15. හයවන පරාක්‍රමබාහු රජතුමා විසින් යාපනය ප්‍රදේශය යටත් කර ගැනීම සඳහා පිටත් කර හරින ලද කුමාරයා කවුරුන් ද?
1. බුවනෙකබාහු කුමරු
2. සපුමල් කුමරු
3. අම්බුලුගල කුමරු
4. දෙවන පරාක්‍රමබාහු කුමරු

16. චෙංහෝ සෙනෙවියාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකාවට චීන ආක්‍රමණයක් සිදුවන්නේ කුමන රාජධානි යුගයේ ද?
1. දඹදෙණිය 2. යාපහුව 3. ගම්පොළ 4. කුරුණෑගල

17. "ඊනිඩ්" නම් උසස් රෝම පද්‍ය ග්‍රන්ථය රචනා කරන ලද කතුවරයා කවුරුන් ද?
1. හෝමර් 2. යුරිපිඩීස් 3. සොපොක්ලීස් 4. වර්ජිල්

18. ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලොවට උරුම වූ දායාද පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.
1. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය
2. පාලම් තැනවීමේ තාක්ෂණය
3. මංමාවත් තැනීමේ තාක්ෂණය
4. කිතු දහම

19. බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා ලෙස සැලකෙන ග්‍රීක ජාතිකයා කවුරු ද?
1. ඇරිස්ටෝටල් 2. ආකිමිඩීස් 3. හිපොක්‍රටීස් 4. සොක්‍රටීස්

20. රෝම ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ටත්වය පෙන්වන නිර්මාණයක් පහත පිළිතුරු අතරින් තෝරන්න.
1. පැන්තියන් දේවස්ථානය
2. නගරවල ඉදිකළ සුඛෝපභෝගී නිවාස
3. කැරකැල්ලා නාන තටාකය
4. නීරෝ අධිරාජ්‍යයාගේ ලෝකඩ හිස

(ලකුණු 20 × 2 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

01. (i) පහත A, B, C යටතේ ඇති පින්තූර සම්බන්ධව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉර මත ලියන්න.

A



(1) A පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?

.....................................................................................

(2) මෙය පිහිටා ඇති නගරය කුමක් ද?

.....................................................................................

(ලකුණු 04)

B



(1) B පින්තූරයෙන් දැක්වෙන නගරය කුමක් ද?

.....................................................................................

(2) එය අයත්වන රට කුමක්ද?

.....................................................................................

(ලකුණු 04)

C



(1) C පින්තූරයෙන් දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?

.....................................................................................

(2) මෙය ඉදිකර ඇති නගරය කුමක්ද?

.....................................................................................

(ලකුණු 04)

(ii) මෙහි දක්වා ඇති සිතියමෙහි A, B, C, D වශයෙන් පෙන්වා ඇති නගරවල නම් තිත් ඉරමත ලියන්න.




A .............................................

B .............................................

C .............................................

D .............................................

(ලකුණු 04)

02. (i) හේන් හැඳින්වීමට පහත මූලාශ්‍රවල භාවිතා කර ඇති නම් පිළිවෙළින් ලියන්න.
A උම්මග්ග ජාතකය B සෙල්ලිපි (ලකුණු 02)

(ii) බදුලු ටැම් ලිපියේ සඳහන් වෙළෙඳ පොළ පාලනයට අදාළ නීති දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) අතීත ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම සම්බන්ධ පහත තොරතුරු ලියන්න.
C - වෙළෙඳ සබඳතා පැවැත් වූ රටවල් දෙකක්
D - විදේශ රටවලට යැවූ මෙරට වටිනා වෙළෙඳ භාණ්ඩ දෙකක්
E - විදේශ වෙළෙඳාමේ දී වැදගත් වූ මෙරට වරායක් (ලකුණු 05)

03. (i) අනුරාධපුර යුගයේ මුල් කාලයේ ප්‍රාදේශීය පාලනය සම්බන්ධ පහත තොරතුරු ලියන්න.
(a) - රාජ්‍යයේ කුඩාම පරිපාලන ඒකකය
(b) - එහි පාලකයා හැඳින් වූ නම (ලකුණු 02)

(ii) රටේ මධ්‍ය පාලනයේ ප්‍රධානියා ලෙස රජුට අයත් කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) මහා විජයබාහු රජුගේ ආගමික සේවය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

04. (i) අනුරාධපුර යුගයේ අගභාගය වන විට මෙරට දේශපාලන කටයුතු කෙරෙහි බලපෑම් කළ දකුණු ඉන්දීය රාජ්‍ය දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) මහා පරාක්‍රමබාහු රජු පිළිබඳ පහත තොරතුරු ලියා දක්වන්න.
A - මහා පරාක්‍රමබාහු රජු දක්ඛිණ දේශයේ ඉදිකළ නව නගරය
B - මහා පරාක්‍රමබාහු රජු හා ගජබාහු රජු අතර ගිවිසුමක් පිළිබඳ සඳහන් සෙල්ලිපිය (ලකුණු 04)

(iii) නිශ්ශංක මල්ල රජු මුහුණ දුන් අභියෝග දෙකක් සඳහන් කර, එම අභියෝග ජය ගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

05. (i) ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක සංස්කෘතික උරුම දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) පොළොන්නරුව නගරයේ දක්නට ලැබෙන බෞද්ධ හා හින්දු ස්මාරක හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) සීගිරියේ පොකුණු හා ජල තාක්ෂණය කරුණු දෙකක් යටතේ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. (i) පොළොන්නරු රාජධානිය බිඳ වැටීමෙන් පසු පහත ස්ථානවල බලකොටු පිහිටුවා ගත් නායකයින් A හා B අනුපිළිවෙළින් ලියන්න.
(a) ගෝවින්දමලය (b) මිණිපේ (ලකුණු 02)

(ii) පහත තොරතුරුවලට අදාළ පිළිතුරු ABCD අනුපිළිවෙළින් ලියන්න.
A - හයවන පරාක්‍රමබාහු රජුට විරුද්ධව උඩරට කැරැල්ලක් ආරම්භ කළ ප්‍රාදේශීය පාලකයා
B - ගම්පොළ රාජධානි සමයේ මෙරට පැමිණි අරාබි දේශ සංචාරකයා
C - මිසරය සමඟ වෙළෙඳ සබඳතා පැවැත්වූ රජතුමා
D - යාපනයේ ආරම්භක පාලකයා (ලකුණු 04)

(iii) දඹදෙණියේ II වන පරාක්‍රමබාහු රජුගේ සේවාවන් පිළිබඳ වාක්‍ය පහක් ලියන්න. (ලකුණු 05)

07. (i) ග්‍රීසියේ පැවති පෞර රාජ්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පහත තොරතුරුවලට අදාළ පිළිතුරු A B C D අනුපිළිවෙළින් ලියන්න.
A - ක්‍රීට දිවයින මුල් කරගෙන පැවති ශිෂ්ටාචාරය
B - ග්‍රීක්වරු ශ්‍රී ලංකාව හැඳින් වූ නම
C - ඉතාලි භූමියේ රට මැදින් විහිදී ගිය කඳුවැටිය
D - රෝමය ගොඩනැගුවේ යයි සැලකෙන වීරයා (ලකුණු 04)

(iii) රෝමය පාලනය කළ කීර්තිමත් පාලකයින් දෙදෙනෙකු නම් කොට, එම රාජ්‍ය කාල වලදී සිදු වූ වැදගත් සිදුවීම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)